" කොල්ලන්ගෙ ඇසුරෙන්
පුතේ! උඹෙ දිවි
නතර විය හැක
දිවැස් බැල්මෙන්
එදා කී එවදන් තාත්තේ......
ඔබයි මගේ අනාගත වක්තෘ......

මෙම නිර්මාණයෙහි ඇතුළත් මෙබඳු යෙදුම් හා සංකල්පනා අපට කුමරතුඟුවන්ගේ "පියසමර" සිහි ගන්වයි. එසේ ම කාලය විසින් ලබාදෙන ජීවිතාවබෝධය හා සාධුත්වය පුද්ගලයා තුළ ඇති කරවන පරිවර්තනය කවියා ප්‍රත්‍යක්ෂ කරවයි.

" ඔබයි මගෙ ඉටු දෙවි
එදා විරසක වී
ඔබ බසට වෛර කළ ද
අදයි මට ඔබ අග මෙහෙ
මෙනෙහි කර සිත පුබුදු කළ හැකි.
නැත ද ඔබ දිවි කතර
ඇත ඔබ සසර කතර
ඔබේ ම පුත් වීමට
පුරමි පෙරුම් ඉත සිතින.

කවියා ස්වකීය හැඟීම් අව්‍යාජ ලෙස හසුරුවමින් පිතෘත්වය පිළිබඳ හෙළිකරන යථාර්ථය සහෘද මනසට ද සාධාරණීකරණය වේ.

වරෙන්තුව කාව්‍ය සංග්‍රහයෙහි ඇතුළත්, ගුරුතුමිය, විමල් දිසානායකට, පරාක්‍රම කොඩිතුවක්කු, සෝමහිමි යන නිර්මාණ හුදු පුද්ගලාභිවාදන නොව පුද්ගලයා, සමාජය හා කාලය පිළිබඳ පරිණාමය හා විචලනය පුද්ගලාන්තර බැඳීම්, සහෘදභාවය ද ජීවිතයේ ස්වභාවය ද පසක් කර දෙමින් පහන් සංවේගයක් දනවන නිර්මාණ ලෙස හැඳින්විය හැකිය.

සිංහල සමාජීය හා සංස්කෘතික ස්වභාවය අනුව අතීතයේ සිට ම කවිය භාව විරේචනය, භාවවිශෝධනය හා භාවෝපසමනය සඳහා බහුල වශයෙන් ම උපයෝගී කරගත් මාධ්‍යයකි. එහිදී ඒ ඒ කවියාගේ ප්‍රතිභාව, බහුශ්‍රැතතාව, හා සතතාභ්‍යාසය ද ජීවිතය හා ලෝකය කෙරෙහි ඔහු හෙළන දෘෂ්ටිය ද අනුව නිර්මාණ අනන්‍යතාව පිළිබිඹු වේ. එමගින් කාව්‍ය ක්ෂේත්‍රය විචිත්‍ර ලක්ෂණ උරුමකර ගනිමින් පෝෂණය වේ. "වරෙන්තුව" නම් කාව්‍ය නිර්මාණ සංග්‍රහයෙන් මහාචාර්ය කුලතිලක කුමාරසිංහයන් සතු එකී කාව්‍යකරණ සාධනා මැනවින් ප්‍රදර්ශනය වේ.

*මහාචාර්ය දර්ශන රත්නායක*

# 28

# සාර්ථක කවියක් බිහිවීම වූ කලී...

*උදේනි සරච්චන්ද්‍ර*

සාර්ථක කවියක් බිහිවීම වූ කලී අපූර්ව වස්තු නිර්මාණයකි. එම නිර්මාණය තුළ අපූර්වත්වය ඇති වන්නේ කවියා සතු ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය සහ සතතාභ්‍යාසය තුළිනි. එසේ බිහිවන කවිය සහෘදයා තුළ කම්පනයත්, ප්‍රකම්පනයත් ජනිත කරමින් නාද නින්නාද දෙයි.

අනිකුත් සාහිත්‍යාංග සමගින් කාව්‍යකරණයට ද ආසක්ත කුලතිලක කුමාරසිංහ කිවිඳුන්ගේ තෙවන කාව්‍ය සංග්‍රහය ලෙසින් "වරෙන්තුව" කාව්‍ය සංග්‍රහය පළ කර ඇත. මීට ඉහතදී "නැත ලොවේ අන් රසඳුනා" සහ "අසනිපාතය" නමින් කාව්‍ය සංග්‍රහ දෙකක් පළ කර ඇති කුමාරසිංහ කිවිඳුන්ගේ "වරෙන්තුව" කාව්‍ය සංග්‍රහය විවිධ කාව්‍යා කෘතිවලින් සමලංකෘතය. කවියා සිය අත්දැකීම් සූචනය කිරීම සඳහා විවිධ කාව්‍යාකෘති උපයෝගී කරගෙන ඇත්තේ එම අත්දැකුමේ හැඩරුවට අනුරූපවන ලෙසිනි.

පද්‍ය රචනා හතළිස් අටකින් සමන්විත මෙම කාව්‍ය සංග්‍රහයේ ජීවිත යාත්‍රාවේ විවිධ ඉසව් පිළිබඳව රචනා කර ඇති පද්‍යයන් ගෙන් විශදවන්නේ කවියාගේ වින්දනීය අත්දැකීම් ය. කාලයාගේ ගලායෑමත් ඒ හා සබැඳි ප්‍රේමනීය හා ඛේදනීය අත්දැකීම් මෙහි සංගෘහිතය. කුමාරසිංහ කිවිඳුන් විසින් රචිත ප්‍රේමනීය කාව්‍ය රචනා අතර "සඳමඬල" කාව්‍ය රචනාව කැපී පෙනේ. මෙහිදී කවියා ප්‍රේමයේ සුසිනිඳු බව සුපුන් සඳ සේ දකිමින් කවි බස රූපකාර්ථවත්ව යොදා ගෙන ඇත.

" මැදියම් රැයෙ නැගිට
ඔබේ සුදු මුහුණ දෙස
මා බලා සිටින සඳ
පොහොය පසළොස් රැයේ
තුරු අතර සැඟව සිටි
මඬල පුරසඳ හොරෙන්
මගේ සිත හඳුනාගෙන."

එමෙන්ම "ළඳ" නමැති පද්‍ය රචනය තුළින් සියුමැලි ළඳකගේ වත කමල සඳමඬල නොව අරවින්දයක් ලෙස චිත්‍රණය කර ඇත්තේ උචිත වාං මාලාවකිනි.

" මුව මඬල පැහැපත්ය
වටකුරුය
රෝස පැහැයෙන් දිලෙයි
සඳ මඬල නොව සදිසි
අරවින්දයකි පිපුණු තඹරවිල"

කවියා විසින් රචිත "සොඳුරිය" යන පද්‍ය රචනාවේදී ද උපයුක්ත කවිබස ප්‍රේමාදර හැඟීම් ජනිත කිරීමට සමත් වී ඇති අයුරු දක්නට පුළුවන.

" ඔබෙ මුව මඬල තවමත් සොඳුරිය සොඳුර
ඔබෙ නෙත් සඟල තවමත් දිදුලයි කළණ
ඔබෙ රන් අදර පුබුදුවයි මගෙ ලේ නහර
ඔබගෙන් බැහැර නැත මට ජීවන පහුර"

මෙහි එන "සඳලිය" නමැති පද්‍ය රචනය සඳහා කවියා යොදා ඇති වංමාලාව තුළින් අවදි වී නොසන්සුන්වන ප්‍රේමය මැනවින් චිත්‍රණය කර ඇති සැටි බලනු මැනවි.

" මැදියම් රැයේ නින්දට ගියමුත් යහනේ
මතකය අවදි වී සිත සන්සුන් නොවුනේ
සිතිවිලි බඹර කැල ගුමු ගුමු නද දෙමිනේ
ඇය ගැන සිතීමට මා යොමු කළෙ සෙදිනේ "

කවියා අතීත ස්මරණයක යෙදෙමින් රචනා කර ඇති "පිතෘත්වය" හොඳ රචනයකි. දරු සෙනෙහසින් පිරි හදවතින් යුතුව නේක දුක් ගැහැට විඳිමින් සිය දරුවන් තනන්නට වෙහෙස ගත් පියකු පිළිබඳව රචනය කර ඇති මෙම පද්‍ය රචනය පිය ගුණය මැනවින් විවරණය කරයි. මෙහිදී කවිය පෙළ ගස්වා ඇති අයුරු විමසා බැලීම වටී.

" කොලු රැනෙන් මා ගලවා ගනු පිණිස
පියතුම ඔබයි එදවස මා හඹා ගියේ
නොහිතෙන් වේදනාවෙන් ගේ තුළට වැද
පොත ගෙන අතට පාඩම් කෙරු බව ඇත්ත
සතොළොස් වසරකට පසු මට ඔබ සිහිවේ
අමතක කරනු කෙළෙස ද එදවස මෙ මම"

කාලය අප කාහටත් නොදැනීම ගලා ගොස් මරණයේ දොරකඩ අභියසට පැමිණ ඇති අයුරු මෙම කාව්‍ය සංග්‍රහයේ ග්‍රන්ථ නාමය වන "වරෙන්තුව" පද්‍ය රචනය තුළින් ඉදිරපත් කර ඇත්තේ කිසියම් කම්පනයක් අප හදවත් තුළ ජනිත කරමිනි. උපන්දිනය කවියා දකින්නේ මරණ වරෙන්තුවක් ලෙසිනි.



" මට අවුරුදු පනස් අටයි
මරණයෙ දොරටුව අසළට
කෙමෙන් කෙමෙන්
බඩ ගාගෙන ළඟාවෙමින් සිටිනෙමි මම
උපන්දිනය හඬගා මට
මරණ වරෙන්තුවක් ලෙසින්"

කවියාට සැබෑ ආලෝකයක් වූ මහැදුරිඳු විමල් දිසානායක සූරීන් විසින් ශිල්ප ධනය නොමසුරුව පරිත්‍යාග කරමින් සිදු කළ මහාර්ඝ සේවාව සිහිපත් කරමින් රචනා කර ඇති "විමල් දිසානායකට" පද්‍ය රචනය තුළින් සිය ගුරුවරයා විසින් සිය නැණ'ස පෑදූ අයුරු සිත්තම් කරන්නේ සැබෑ බැති සිතිනි.

" ඔබයි අපෙ රස නහර
කළඹවා පුබුදු කළ
මග හසර සිල්ප දන නොමසුරුව
බෙදා හළ මහැදුරිඳු
ඔබ දෙසුම් - රසබරය, සුවියත්ය
හිස්වූ සිත් බඳුන
රසදියෙන් පුරවාලු නැණ පහන"

නව කවියේ පෙර ගමන්කරු සේ සැලකෙන පරාක්‍රම කොඩිතුවක්කු කිවිඳුන්ගේ විප්ලවීය කවි මඟ සිහිපත් කරමින් රචනා කර ඇති "පරාක්‍රම කොඩිතුවක්කුට" නමැති පද්‍ය රචනය එම කිවිඳුන්ගේ කවි මඟහි ප්‍රබලත්වය, සමාජ සත්‍යය හා යථාර්ථය මැනවින් විදාරණය කරයි. සමාජ අසාධාරණයට එරෙහිව ඔහු ලියූ කවියේ සත්‍යාවේක්ෂණය එමගින් වර්ණිතය.

" තාරුණ්‍යයෙ ඔද තෙද
සාහිත කෙත තරණය කර
අස්වද්දා
ඉක්මන් අස්වනු නෙළා ගැනුමට
විප්ලවයේ රණහඬ
කවියෙන් පෙන්වා ඔද තෙද"

"රංචාගොඩ ළමයාගේ කවි" පද්‍ය රචනය පස්මත් විරිත සිහිපත් කරමින් රචිතය. එහිදී කවියා යොදාගත් වදන් මාලාව උත්ප්‍රාස ගුණයෙන් අනූනය. රිද්මයානුකූලය.

" උඹයි මගේ ජීවිතයේ මසන් ගස
ගස උඩබලා ගස යට නැවතී සිටියා
නුරා ගින්න අවුලා උඹ ඔමරි පපා
මුවඟින් සිනා හෙළුවා මගෙ නොදැන්මට"

ජීවිතයේ ගති සොබාවන්ගේ වෙනස්වීම පිළිබිඹු කරමින් රචිත "එදා අද" පද්‍ය රචනය සඳහා කවියා උචිත සංකල්ප රූප යොදා ගෙන ඇත්තේ ජීවිතයේ අනිත්‍ය ස්වභාවය පසක් කරවමිනි.

"ඇගෙ මුහුණ එදා සඳ මඬලකි.
මෙදා ගිනිගත් වැදිරි මූණකි
ඇගෙ නළල එදා දේදුන්නකි
මෙදා විසිකළ දැහැටි දණ්ඩකි"

සරසවි මහැදුරකු වන කුලතිලක කුමාරසිංහ කිවිඳුන් විසින් සරසවි ජීවිතය ඇසුරෙන් නිර්මාණය කර ඇති "මම" නමැති පද්‍ය රචනය දහසක් මානව මානවිකාවන් අතර සිටියද හදවතින් හුදකලා පාළුවක නිමග්න වී ඇති අයුරු විවරණය කරන්නේ සියුම් ශෝකී ස්වරයෙනි.

"දැරුවද උසස් තනතුරු මා සරසවියේ
සිටියද පිරිවරා උගතුන් සරසවියේ
හැඟුණද සැණින් සිසු පැන ඒ සරසවියේ
මා හුදෙකලා වී ඇත අද සරසවියේ"

මෙම කාව්‍ය සංග්‍රහයේ එන ඇතැම් පද්‍ය රචනා එනම් "ගැලවුම්කරු", "ත්සුනමි", "තාත්තා", "මහලුවිය" "ඇයි", "කවුද", "එදවස", "නංගී", "මගේ චූටි" යන රචනාවල අත්දැකීම් සූචනය කර ඇත්තේ කාව්‍යෝචිත බස් වහරකට වඩා වාර්තාමය ස්වරූපයෙනි.

ඒ කෙසේ වුවද, සමස්ථයක් ලෙස ගත්විට "වරෙන්තුව" කාව්‍ය සංග්‍රහය කුලතිලක කුමාරසිංහ කිවිඳුන්ගේ කවිත්වයේ සාධනීය ලක්‍ෂණ ප්‍රකට කරන අතර ම සතතාභ්‍යාසයෙන් පරිණත කවි නිර්මාණය කිරීමෙහිලා විකසිත වන කවිත්වයක පෙරමග ලකුණු පිළිබිඹු කරන බැව් සඳහන් කළමනාය.

# 29

## Attempt to introduce advanced literary theory in Sinhala

*Indeewara Thilakarathne*

Satara Doratuwa, a book by Prof. Kulatilaka Kumarasinghe and Prof. Wimal Dissanayake is an important contribution to Sinhalese literary studies. The book attempts at introducing the latest developments in the sphere of literary theory to Sinhala readers in lucid and simple Sinhalese.

The primary objective of the book is to focus on four important concepts in literary creations. The four concepts are the writer, the text, the reader and the context. Satara Doratuwa or four doorways refer to these four aspects. The book in the form of an interview by Prof. Kulatilake Kumarasinghe of Prof. Wimal Disanayake is basically attempting to introduce some of the most advanced literary theory around the four concepts.

The book traverses the evolution of literary theory from early days of liberally humanistic literary criticism to the post modern literary criticism. Dominant literary theories such as Marxist literary theory, application of psychology in literary criticism and the school of feminist literary criticism have been described in simple terms.

Though it is not possible to discuss the advanced literary theories that the book attempts to introduce, it is pertinent to some of the most advanced literary theories that Satara Doratuwa discusses in order to bridge the knowledge gap in Sinhalese readership

In discussing the gradul decline of the author's power, the authors have cited major thesis in the area such as those of Ronald Barthes. However, the authors pointed out that what Bathes pointed out was that the author has not died as some would understand but authors power has dramatically reduced over the years.

Structuralism is another important literary theory that the book touches on. It is a mode of analysis which profoundly influenced literary criticism in the 20th century. Structuralism is effectively applied in the field of "Narratology". Narratologists analyse the systematic features and functions of narratives, attempting to isolate a finite set of rules to account for the infinite set of real and possible narratives using structuralist methods and principles. Structuralism also deals with a part of the oretical baggage of Marx and Freud.